# සන්ෆෝ අර්ධ මැරතන් තරගය හෙට

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් දිනය සමරනු වස් ශ්‍රී ලංකා එක්සත් ජාතීන්ගේ මිත්‍රත්ව සංවිධානය වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය හා එක්ව පවත්වනු ලබන සන්ෆෝ අර්ධ මැරතන් තරගය මේ මස 10 වැනි දින පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මෙම තරගය මහර, කඩවත, බියන්විල කුමර මහ විදුහල අසලින් ආරම්භ කර කොළඹ නුවර ප්‍රධාන මාර්ගය ඔස්සේ පැමිණ සුගතදාස ක්‍රීඩාංගනයෙන් අවසන්කෙරේ.

වයස අවුරුදු 18ට අඩු බාලක බාලිකා වයස අවුරුදු 18ට වැඩි පිරිමි හා කාන්තා යන වයස් සීමාවන් යටතේ තරග පැවැත්වේ.

ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට ත්‍යාග හා කුසලාන පිරිනැමෙන අතර සහභාගි වන සැමට විශේෂ සහභාගිත්ව සහතිකයක් හිමිවේ.